12

ඇවිදින කොළයා

අප අවට පරිසරයේ විවිධ සත්තු ජීවත් වෙති. ඔවුන්ගේ බාහිර පෙනුම, ජීවන රටා ආදි තොරතුරු දැන ගැනීමට විද්‍යාත්මක පත පොත කියවිය යුතු ය. සිංහලෙන් එබඳු පොත් ලිවීමට පුරෝගාමී වූ මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ 'විද්‍යා විනෝද කතා' පෙළෙන් උපුටා ගත් කතාවක් මෙහි දැක්වේ.

මිත්‍රයෝ දෙදෙනෙක් කැලෑවක් මැදින් ගමන් කළෝ ය. කැලෑව මැදට පැමිණි ඔවුහු වලසකු දුටුවෝ ය. එකෙක් වහ වහා ගසකට නැංගේ ය. අනෙකාට ගසට නැඟ ගන්ට බැරි විය. ඔහු පණ බේරා ගත්තේ උපායකිනි. ඔහු බිම දිග ඇදී මළ මිනිහකු මෙන් කිසි ම හැලහොල්මනක් නැතිව සිටියේ ය. වලසා ඔහුට ළං වී බලා ඒ මළ කඳෙකැයි සිතා කිසිවක් නොකොට ආපසු ගියේ ය.

අන්තරායෙන් ගැලවීමට මෙබඳු උපාය යොදන්නේ මනුෂ්‍යයා පමණක් නොවේ. බොහෝ සත්තු ද අන්තරාය වැළැක්වීමට උපාය යොදති. සතුරන්ගෙන් බේරීමට කුරුමිණි සතුන් යොදන උපාය ඇසුවොත් ළමයින් පමණක් නොව සමහර විට වැඩිහිටියෝ ද කම්මුල්වල අත් ගසා ගෙන පුදුමය ප්‍රකාශ කරති.

ගහේ ඉතිවල එල්ලෙමින් තිබෙන විට කොළ සුළඟින් සෙලවේ; බිම වැටුණු විටත් සමහර විට සුළඟින් කොළ සෙලවේ. එසේ වුව ද ඇවිදින, කෑම කන, බිත්තර දමන කොළයක් දකින්ට ලැබුණොත් පුදුම නොවන ළමයෙක් සිටිත් ද?

මෙහි ලංකාවේ සතකුගේ ද උගේ බිත්තරවල ද ඡායාරූප වෙයි. ඌ කොළයකට සමාන ය. ඌට 'කොළයා'යි කියන්නේ එහෙයිනි. අතට ගෙන බැලුවකුට පවා මූ කොළයක් නොව සතෙකැයි කිව නොහැකි ය. කුමක් නිසා ද? හැඩහුරුකමිනුත් පාටිනුත් ඌ කොළයකට ම සමාන බැවිනි. හැම අතින් ම කොළයකට සමාන බැවින් බොහෝ දෙන මේ සතුන් කොළවලින් හට ගනිතියි විශ්වාස කරති. එය වැරදි විශ්වාසයකි. මේ සතුන් හට ගන්නේ කොළවලින් නොව බිත්තරවලිනි.

මේ සතා කොළයක හැඩහුරුකම ගන්නේ කුමට ද? මිනිසකු වලසාගෙන් බේරීමට මළ කඳක් මෙන් වූ හැටි මෙහි මුලින් කියා ඇත. කොළයා කොළයක

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හැඩහුරුකම ගැනීමට හේතුවත් මෙබඳු කරුණකි. එනම්, කුඩා සතුන් අල්ලා ගෙන කන කුරුල්ලන්ගෙන් ද වෙනත් සතුරන්ගෙන් ද බේරීම පිණිස ය.

කොළ හැළුණු ගසක් යට සිටින කොළයකු සෙවිල්ලෙන් බැලුවත් ඌ අපට වහා නොපෙනේ. කොළයක හැඩහුරුකමත් පාටත් ඇති ඌ අපේ පයකට පෑගෙන්ට පුළුවන. අපේ පයකට පෑගුණොත් සමහර විට ඌ මිය යන්නේ ය.

එසේ වුවහොත් කොළයක හැඩහුරුකම ගැනීම කොළයාගේ ආරක්ෂාවට නොව විනාශයට හේතු වෙයි. කොළයා කොළයෙහි හැඩහුරුකම ගන්නේ මිනිසුන්ගෙන් බේරීමට නොවේ. මිනිස්සු උගේ සතුරෝ නොවෙති. පක්ෂීහු උගේ සතුරෝ ය. එබන්දන්ගෙන් බේරීමට කොළයාට කොළයේ හැඩහුරුකමත් පාටත් ඉතා ප්‍රයෝජනවත් ය.

පිහාටු හකුළා පිට මැද එක් කොට තබා ගෙන සිටින විට ඌ කොළයකට සමාන ය. පිහාටු දෙක එක් වන තැන කොළයෙහි මැද නාරටිය වැන්න. මැද නාරටියෙන් දෙපැත්තට ඇඳුණු හීන් නාරටි වැනි නාරටි ද කොළයාගේ පිහාටුවල ඇත්තේ ය. ඇතැම් විට කොළයා ඉදුණු කොළයක පාටින් යුක්ත වෙයි. සමහර විටෙක නිල් කොළයක පාටින් යුක්ත වෙයි.කොළයා බිම සිටින විට කොළයක් ම වැන්න.

උඟ බිම බඩ ඇන ගෙන ම සිටින බැවිනි. උඟ ගමන් කරන්නේත් බඩ ගාන්නාක් මෙනි. මෙසේ හැම විදියෙන් ම කොළයක් බව පෙන්වීමට තැත් කරන මූ කොතරම් කපටි සතෙකු විය යුතු ද? කොළයා මේ කපටිකම් කරන්නේ පක්ෂීන්ගෙන් බේරීම පිණිස ය.

කොළයා අනෙක් කෘමි සතුන් මෙන් මස් කා ජීවත් වන්නෙක් නොවේ; කොළ කා ජීවත් වන්නෙකි. උගේ බිත්තර දැමීම ද අනෙක් කෘමි සතුන්ගේ බිත්තර දැමීමට වෙනස් ය. ඇතැම් කෘමි සත්තු වළවල් හාරා එහි බිත්තර දමති. සමහරු කොපුවක් සාදා එහි බිත්තර දමති. සමහරු ගසක කොළවල බිත්තර අලවති. සමහරු පැළෑටියක කඳ විද ඒ තුළ බිත්තර දමති. කොළයා කුරක්කන් වපුරන්නාක් මෙන් බිම බිත්තර දමයි. උගේ බිත්තර ද ඇට වර්ගයක් වැන්න. උගේ බිත්තරයක් අතට ගෙන බැලුවත් පෙනෙන්නේ කරිවිල ඇට වැනි ඇට වර්ගයක් ලෙසිනි.

අවබෝධය

1. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. කොළයාට එම නම ලැබුණේ ඇයි?
ii. ආත්මාරක්ෂාව සඳහා කොළයා යොදා ගන්නා උපාය මාර්ග මොනවා ද?
iii. කතුවරයා කොළයාගේ බාහිර ස්වරූපය විස්තර කර ඇත්තේ කෙසේ ද?
iv. අනෙක් කෘමි සතුන් බිත්තර දමන ආකාරය හා කොළයා බිත්තර දමන ආකාරය අතර ඇති වෙනස කුමක් ද?

2. නිවැරදි පිළිතුර තෝරන්න.

i. පාඩමෙහි සඳහන් ඇවිදින කොළයා නම් කෘමි සතා හටගන්නේ,
(අ) කොළවලිනි. (ආ) බිත්තරවලිනි. (ඇ) ජලයෙනි.

ii. සතුරන්ගෙන් බේරීමට කොළයාට ප්‍රයෝජනවත් වන්නේ,
(අ) හැඩහුරුකම සහ පාට යි.
(ආ) කකුල් සහ වේගවත් බව යි.
(ඇ) නිශ්ශබ්දතාව සහ පහරදීම යි.

iii. කොළයාට ඇත්තේ,

(අ) විෂ දළ ය. (ආ) වලිගයකි. (ඇ) පිහාටු ය.

iv. කොළයා බිම සිටින විට කොළයක් වැනි ම වන්නේ,

(අ) නොසෙල්වෙන නිසා ය.

(ආ) කොළ අතර ම සිටින නිසා ය.

(ඇ) බිම බඩ ඇන ගෙන ම සිටින නිසා ය.

v. කොළයාගේ බිත්තර සමාන වන්නේ,

(අ) ඇට වර්ගයකට

(ආ) කුරක්කන්වලට

(ඇ) කොළයකට

3. **පහත සඳහන් ප්‍රකාශ හරි නම් ☑ ලකුණ ද වැරදි නම් ☒ ලකුණ ද යොදන්න.**

i. අන්තරායෙන් ගැලවීමට උපාය යොදන්නේ මිනිසා පමණි. ( )

ii. කොළ හැළුණු ගසක් යට සිටින කොළයකු දෙස සෙවිල්ලෙන් බැලුවත් ඌ අපට වහා නොපෙනේ. ( )

iii. අපේ පයට පෑගුණත් කොළයා මිය යන්නේ නැත. ( )

iv. මිනිස්සු කොළයාගේ සතුරෝ ය. ( )

v. නිල් කොළයක පාටින් ද ඉදුණු කොළයක පාටින් ද යුතු කොළයෝ වෙති. ( )

vi. කොළයා ගමන් කරන්නේ බඩ ගාන්නාක් මෙනි. ( )

ලිඛිත අභ්‍යාස

1. **පහත දැක්වෙන පදවලට සමානාර්ථ පද පාඩමෙන් සොයා ලියන්න.**

i. යහළුවෝ   ii. අනතුර   iii. ප්‍රතිවාදීන්

iv. කකුල   v. බීජ වර්ග

2. **පහත සඳහන් වචන යොදා වාක්‍ය නිර්මාණය කරන්න.**

i. උපාය   ii. අන්තරාය   iii. හැඩහුරුකම

iv. සෙවිල්ලෙන්

1. **පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත වන්න.**

- ගෙවත්තේ හමු වන කෘමි සතකු හොඳින් නිරීක්ෂණය කර ඒ පිළිබඳ විස්තර ඇතුළත් කොට කුඩා ලිපියක් සකස් කරන්න.
- එම ලිපිය කියවා, ඔබ මින් පෙර එම කෘමියා පිළිබඳ නොදන්නා තොරතුරු කොපමණ එහි ඇතුළත් ව ඇත්දැයි විමසා බලන්න.
- පන්තියේ යහළු යෙහෙළියන්ගේ ලිපි සමග ඔබේ ලිපිය හුවමාරු කරගෙන කියවා, කෘමි සතුන් පිළිබඳ දැනුම වර්ධනය කර ගන්න.

2. **ඇවිදින කොළයා පිළිබඳ ඔබ සිත් ගත් තොරතුරු පන්තිය හමුවේ ඉදිරිපත් කරන්න.**
3. **විද්‍යා විනෝද කතා පොත කියවන්න.**
4. **විවිධ විෂයයන් අළලා මාර්ටින් වික්‍රමසිංහ ලියූ පොත්පත් ලැයිස්තුවක් සකස් කරන්න.**

විරාම ලක්ෂණ

කථා කිරීමේ දී අසන්නාට පැහැදිලි ලෙස තේරුම් ගැනීම සඳහා යම් යම් ස්ථානවල දී සුළු විරාමයක් තැබීම, හඬ උස් පහත් කිරීම, විස්මය, ශෝකය වැනි ඉරියව් මුහුණින් පළ කිරීම ආදිය සිදු කෙරේ. කථනයේ දී යෙදෙන මෙම උපක්‍රම වෙනුවට ලේඛනයේ දී යොදා ගැනෙනුයේ විරාම ලක්ෂණ යි.

තිත (.)

◆ වාක්‍යයක අවසානයට යෙදේ.

උදාහරණ:- අපි හත් පැයක් පමණ යාත්‍රා කොට දූපතේ දකුණු පැත්තට ළඟා වීමු.

◆ පුද්ගල නාමයක මුලකුරු දැක්වීමේ දී යෙදේ.

උදා:- ඩී. එම්. එස්. දිසානායක දි. මු. විමලරත්න

- වචන කෙටි කර දැක්වීමේ දී යෙදේ.

උදා:- ර.මු.නී.ස. (රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව)
ලි.ප.තැ. (ලියා පදිංචි තැපැල්)
රා.සේ.පි. (රාජ්‍ය සේවය පිණිසයි)
පෙ.ව. (පෙරවරු)
ප.ව. (පස්වරු)

කොමාව (,)

ලේඛනයේ විවිධ අවස්ථාවල දී කොමාව යෙදෙයි.

- වාක්‍යයක කෙටි විරාමයක් දැක්වීමට කොමාව යෙදෙයි.

උදා :- දෙවන සතියේ අවසාන දවසේ රැයෙහි, ගල් ගුහාව ඉදිරියෙහි වූ ගල් තලාවක දිගා වී උන් ජින්නා නැගී, මඳක් ඈතින් වූ අනෙක් ගල්තලාවක වාඩි වී, ගඟ දෙස බලාගෙන උන් මට හඬ ගෑවේ ය.

- වාක්‍යයක ආමන්ත්‍රණ පදයක් යෙදෙන්නේ නම් එය අනෙක් වචනවලින් වෙන් කර දැක්වීම සඳහා යෙදෙන්නේ කොමාව යි.

උදා :- උපාලි මහත්තයා, අර බලන්න.

- වචන මාලාවක් ඉදිරිපත් කරන අවස්ථාවල ඒ වචන කොමා යොදා දැක්වේ.

උදා :- මඩොල් දූවෙහි අප වාසය කළ පැත්ත ක්‍රමයෙන් එළිමහන් පෙදෙසක් වත් ම බතල, මඤ්ඤොක්කා, එළවළු ආදිය වවන ලද හේන ක්‍රමයෙන් විශාල විය.

ප්‍රශ්නාර්ථ ලකුණ (?)

- ප්‍රශ්නයක අවසානයේ දී යෙදේ.

උදා :-දූපතේ ඔය පැත්තේ අවතාරයක් ඉන්නවා යැයි පොඩි ගමරාල අපට කිව්වා මතක ද?

විස්මයාදි ලකුණ (!)

◆ පුදුම සහගත බව, විස්මය පළ කිරීම සඳහා යෙදෙයි.

උදා :- අර, අර බලන්න! එළිය පාත් වෙනවා, ඉස්සෙනවා. ආයිත් ගමන් කරනවා!

◆ ශෝකය පළ කිරීමේ දී යෙදේ.

උදා :- අනේ! අම්මා නැති දරුවා.

◆ හඬ නගා කෙරෙන ආමන්ත්‍රණවල දී හා නියෝගයන්හි දී යෙදේ.

උදා :- දරුවනේ ! ළමයිනේ !
මෙතනින් පාර මාරු වෙනු !

◆ ආශීර්වාදයක්, ප්‍රාර්ථනාවක් හෝ සුබ පැතුමක් කිරීමේ දී යෙදෙයි.

උදා :- සැපවේවා ! ආයුබෝවන් ! සුබ උපන් දිනයක් වේවා !

යුගල උඩු කොමා/පෙරළි කොමා (" ")

◆ යමෙකු කිවූ දෙයක් යළි ඒ අයුරින් ම ලිවීමේ දී යෙදේ.

උදා:- "මේ රෑ දූපත වටේ ඔරු පදින්න ගියොත් ඔරුවේ කෑලි හම්බ වෙන්නෙත් නෑ" යි ජින්නා කීය.

◆ යමක් විශේෂ කොට දැක්වීමට අවශ්‍ය අවස්ථාවල දී යොදා ගැනේ.

උදා:- භාෂා රාශියකට පරිවර්තනය වූ රසවත් නවකතාවකි, මාර්ටින් වික්‍රමසිංහයන්ගේ "මඩොල් දූව."

◆ උද්ධෘත පාඨ සඳහා යෙදේ.

උදා:- "ගල් ලෙන බිඳලා - ලෙන් දොර හැරලා" යනු සිංහබාහු නාට්‍යයට අයත් ගීයකි.

තනි උඩුකොමා (' ')

- උද්ධෘත පාඨයක ඇතුළත තවත් උද්ධෘත පාඨයක් නැතහොත් විශේෂ ව්‍යවහාරයක් දැක්වීමට යෙදේ.

උදා:- "ජාතික වීරයන් ගැන කතා කරන විට 'අයියණ්ඩි බිය නොවන්න මැරෙන හැටි මම පෙන්වමි' යනුවෙන් වීර මද්දුම බණ්ඩාර කළ ප්‍රකාශය බැහැර කළ නොහැකි යැ"යි ඔහු කීවේ ය.
"ඔහුගේ නම ජිනදාස වුව ද මා ඔහුට හඬගාන්නේ 'ජිනේ' 'ජින්නා' යන නම් දෙකින් එකකිනි."

1. පහත සඳහන් ඡේදය විරාම ලක්ෂණ යොදමින් අභ්‍යාස පොතේ ලියන්න.

පොඩි ගමරාල පමණක් නොව වෙනත් ගැමියෝ ද අපේ දූපතට එන්ට වූහ ඇතැම් දවසක ගඟේ සෙල්ලම් පිණිස යාත්‍රා කිරීමටත් මාළු බෑමටත් කොළඹින් පැමිණි පිරිමිනුත් ගෑනුත් ළමයිනුත් මඩොල් දූවට ගොඩ බැස එහි දී දහවල් කෑම කා ගියෝ ය අප දැන හැඳින ගත් ඔවුහු බොහෝ සන්තෝෂ වූහ ඇතැමෙක් කොළඹට එන්න යයි අපට ආරාධනා කළෝ ය මඩොල් දූව වගා කිරීම ගැන කවුරුත් අපට ප්‍රශංසා කළහ වරක් ගාල්ලේ පෙරකදෝරුවකුත් ඔහුගේ බිරිඳ සහ දුවත් පුතාත් මඩොල් දූවට පැමිණියේ පොඩි ගමරාල සමග ය අපි එදින බත් උයා මයියොක්කා තම්බා පොල් සම්බලයක් සාදා කුම්බලා කරවල උයා එයින් ඔවුන්ට සංග්‍රහ කළෙමු

නොමිලේ බෙදා හැරීම සඳහා ය.